# 3 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 08

Part i

## L5, S5, R5, W5

## නිපුණතා ආවරණය - 2021



- කතන්දර කියවා අන්තර්ගතය ප්‍රකාශ කරයි.
- කතන්දර කියවා තර්කානුකූල ව අදහස් ඉදිරිපත් කරයි.
- වාංමාලා පෝෂණය සඳහා වචන එක් රැස් කරයි.
- යුගල පද සහ ප්‍රස්තාව පිරුළු නිවැරදි ව භාවිත කරයි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

For Online Class details WhatsApp 071-9020298

# 3 ශ්‍රේණිය මව්බස (සිංහල)

# $L_5$ $S_5$ $R_5$ $W_5$ ඉගෙනුම් පල

- වාංමාලා සංවර්ධනය සඳහා සවන් දෙයි.
- වාංමාලා සංවර්ධනය සඳහා කතා කරයි.
- වාංමාලා සංවර්ධනය සඳහා කියවයි.
- වාංමාලා සංවර්ධනය සඳහා ලියයි.

## කතන්දර.

- කියවීම් පොතේ ඇතුලත් මහෞෂධ පඬිතුමාගේ කතාව කතාව කියවා පිළිතුරු ලියන්න.

අග මුල සෙවූ හැටි



(1) මියුලු නුවර රජකම් කළ රජතුමා වේදේහ නම් වේ. (.......)
(2) සිරිවඩ්ඪන සිටුතුමාගේ පුතා මහෞෂධ කුමරු ය. (.......)
(3) රජතුමා අග මුල සමාන නැති කිහිරි දණ්ඩක් ගම් වැසියන්ට එව්වේ ය. (.......)
(4) මහෞෂධ කුමරුට කිහිරි දණ්ඩෙහි අග මුල දැන ගැනීමට නොහැකි විය. (.......)
(5) මහෞෂධ කුමරුගේ නුවණ පිළිබඳ දැනගත් රජතුමා සතුටට පත් විය. (.......)

1. මියුලු නුවර ප්‍රධාන ගම අටක් විය ( )
2. යවමැදුම්ගම මියුලු නුවර තිබූ ගමකි. ( )
3. යවමැදුම්ගම නායක සිටුතුමා ජයවර්ධන නම් විය. ( )
4. නායක සිටුතුමාගේ පුතා කෞශල්‍ය විය. ( )
5. රජතුමා අග මුල සමාන කිහිරි දණ්ඩක් ගම්වැසියන්ට එව්වේ ය. ( )
6. ගසක මුල කොටසේ බර අඩුය. ( )
7. රජතුමා මහෞෂධ කුමරුට ප්‍රශංසා කළේ ය. ( )
8. මහෞෂධ පඬිතුමා වේදේහ රජතුමාගේ සේවයට එක් විය. ( )

- අසා ලිවීම.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

## තේරවිලි.

- කියවීම් පොතේ ඇතුළත් ටිං ටිං ගාන්නා තෝරා එවන්නේ පාඩමෙහි ඇතුළත් පහත සඳහන් තේරවිලි තුන් තේරවිලි සහ තේරවිලි කවි වලට අදාළ පිළිතුරු ලියන්න.

1. තපස් රකිනවා
   කෙතේ ඉන්නවා
   මාළු සොයනවා
   කියන්න මගෙ නම - ......................................

2. උඩහ ගෙදර මම යන කොට
   අගර දගර වැලක් තිබුණා
   මල් සුවඳයි ගෙඩි තිත්තයි
   නොතේරුවොත් ටොකු විස්සයි - ......................................

3. ගුලක් බලා රිංගනවා
   ඒක ඇතුළෙ කැරකෙනවා
   ගේ දොර බඩු රැක දෙනවා
   තේරුවොතින් පඩි දෙනවා - ......................................

4. දත් තිබුණත් කටක් නැතේ
   සියලු ම දත් උල් ව ඇතේ
   අවුල් ලිහා හැඩ කරතේ
   නැති ගෙදරක් ඇත්තෙ නැතේ - ......................................

5. පිරිසිදුකම කරන අගේ
   රුවුල ඉත්තෑ කුරු වගේ
   මිදුල වටේ යන එන කොට
   රුවුල ඇදෙයි පොළොව දිගේ - ......................................

## සමානාර්ථ පද.

(රුක, ගුවන, මව, හිමිදිරිය, හිරු, නිවස, පක්ෂියා, විදුහල, හිස, මාර්ගය, කකුල තාරකා, ජලය, පියා, ග්‍රන්ථය)

| 1 ශ්‍රේණිය සියලු සමාන පද | | 2 ශ්‍රේණිය සියලු සමාන පද | |
|---|---|---|---|
| අහස | - .................................. | පාසල | - .................................. |
| අම්මා | - .................................. | ඔළුව | - .................................. |
| තාත්තා | - .................................. | පාර | - .................................. |
| ගස | - .................................. | තරු | - .................................. |
| ඉර | - .................................. | ගෙදර | - .................................. |

- සිතුලගේ රචනය ඡේදයේ යටින් ඉරි ඇඳි සමානාර්ථ පද යුගල කොටු කර එක ම වර්ණයකින් පාට කරන්න. සමානාර්ථ පද යොදා හිස්තැන් පුරවන්න.

උදා : උදෑසන = හිමිදිරිය නිල් පාට

කුරුල්ලා = පක්ෂියා රතු පාට

## සිතුලගේ රචනය

'පුතා, හෙට රචනයක් ලියාගෙන යන්න ඕනෑ කිව්වා නේ ද ? මෙන්න ඒකට හොඳ ප්‍රවෘත්තියක් පෙන්වනවා. එන්න බලන්න' තාත්තා සිතුලට කතා කළා. රූපවාහිනිය බලන තාත්තා අසලින් සිතුල වාඩි වුණා. කැලෑව තුළ සිදු වන අපූරු සිදුවීම් ඇතුළත් පුවතක් රූපවාහිනී තිරයේ දිස් වුණා. රචනය ලියන්න කියන්නේ වනය ගැන. මේක බැලුවොත් නම් මට රචනය ලේසියෙන් ම ලියන්න පුළුවනි. සිතුල තාත්තාට කිව්වේ හරි ම සතුටින්.

රූපවාහිනී තිරයේ දිස් වූයේ අපේ මේ පුංචි දිවයින ආශ්‍රිත ව වැඩෙන ගස් වැල් හා ජීවත් වන සතුන් පිළිබඳ ව යි. අපේ රට පුංචි දූපතක් වුණත්, මීට පෙර නොදුටු, දර්ශන දුටු සිතුල ඇස් අදහා ගත නොහැකි ව බලා සිටියා. වර්ෂාව සහිත රාත්‍රියට සතුන් වනයේ ගත කරන දුක්බර ජීවිතය දුටු සිතුල ගේ නෙත් කඳුළින් තෙත් වුණා. රැය සහ දවල් වෙනසක් නොමැති ව සතුන්ට වගේ ම අපටත් සෙවණ සහ ජලය ලබා දීමට උදවු කරන ගස්වැල් අපේ රටට ම ආශිර්වාදයක් යැයි සිතුලට සිතුණා.

පැය භාගයක පමණ කාලයක් තුළ නැරඹූ දර්ශනයෙන් සිතුල රචනය ලිවීමට ඕනෑ කරන කරුණු රැස් කර ගත්තා. 'තාත්තාට බොහොම ස්තූතියි. අමතක වීමට පෙර මම රචනය ලියන්න ඕනෑ' කියමින් සිතුල හුන් තැනින් නැඟිට කාමරයට ගියා.

ප්‍රවෘත්තියක් - පුවතක්     කැලෑව - වනය

දූපත - දිවයින     රාත්‍රිය - රැය

ඇස් - නෙත්

1. ඒ වනය හරි ම ලස්සනයි. – .උදෑසන ම අපේ ඇඟට සිසිලසක් දැනෙයි.
   ඒ ................................. හරි ම ලස්සනයි.

2. ඒ පුවත මම අසා ඇත්තෙමි.
   ඒ ................................. මම අසා ඇත්තෙමි.

3. ..............................................................................................................

..............................................................................................................

4. ..............................................................................................................

..............................................................................................................

5. ..............................................................................................................

..............................................................................................................

## විරුද්ධාර්ථ පද.

( යට, පොඩි, කෙට්ටුයි, අයහපත්, මිටි, අකමැති, එනවා, අවසානය, පිටුපස, පරවෙනවා, අපරිසිදු, නොදිරන, පහළ, නුසුදුසු, අවලස්සන)

**1 ශ්‍රේණිය සියලු විරුද්ධාර්ථ පද**

කැමති - ..................................

ලොකු - ..................................

උඩ - ..................................

මහතයි - ..................................

උස - ..................................

**2 ශ්‍රේණිය සියලු විරුද්ධාර්ථ පද**

පිපෙනවා - ..................................

ඉදිරිපස - ..................................

පිරිසිදු - ..................................

ලස්සන - ..................................

යනවා - ..................................

- ශ්‍රමදානය ජේදයේ යටින් ඉරි ඇඳි විරුද්ධාර්ථ පද යුගල කොටු කර එක ම වර්ණයකින් පාට කරන්න. විරුද්ධාර්ථ පද යොදා හිස්තැන් පුරවන්න.

## වලස් පවුල

එකමත් එක කැලෑවක ගල් ගුහාවක වලස් පවුලක් ජීවත් වුණා. මේ වලස් අම්මටයි තාත්තටයි දරුවන් දෙදෙනෙකු හිටියා. වලස් අයියා හරි ම කීකරු යි. ඒත් වලස් මල්ලි හරි ම අකීකරු යි. මේ දෙන්න ම ඉගෙන ගත්තේ කැලෑ ගමේ ඉස්කෝලෙ.

පාසලෙන් දෙන පාඩම්වල ප්‍රශ්නවලට වලස් අයියා නම් පිළිතුරු ලියාගෙන යනවා. ගුරුතුමී ඒවා අගය කරනවා. ඒත් මල්ලි නම් ප්‍රශ්නවලට පිළිතුරු ලියාගෙන එන්නේ ඕනෑවට එපාවට. ඒ නිසා ගුරුතුමී වලස් අම්මාට පණිවුඩයක් යැවුවා.

වලස් අම්මේ, මේ ලොකු පුතා ලියාගෙන එන පිළිතුරු, ප්‍රශ්නවලට හොඳින් ගැළපෙනවා. ඒත් පොඩි පුතා පිළිතුරු නොගැළපෙන විදියට යි ලියන්නේ. මේ පිළිතුරු හොඳින් ලියන ආකාරය වලස් අම්මාට කියා දුන්නා. වලස් අම්මා එදා ගෙදර ගිහින් පොඩි පුතාට හොඳින් පිළිතුරු ලියන්න කියා දුන්නා. මේ අයියයි මල්ලියි ඉස්කෝලෙ ඇරිලා ගෙදර ගියා ම ගුහාව පිටුපස තියෙන ගඟට නාන්න යනවා. ගඟේ වතුර සෙමෙන් ගලාගෙන යන තැනකින් නාන්න වලස් අම්මයි, තාත්තයි, පුතාලට පුරුදු කරලා තියෙනවා. ඒත් එදා පොඩි වලස් පුතා වතුර වේගයෙන් ගලන තැනකින් නාන්න සිතුවා. පොඩි පුතා වතුරට ගහගෙන යනකොට වලස් අයියා අම්මටයි තාත්තටයි කෑ ගහලා

කතා කළා. ඒ දෙන්නා ඇවිත් පුතා බේරා ගත්තා. පුරුදු තැනින් නාන්නේ නැති ව නුපුරුදු තැනකින් නාන්න එපා කියලා තාත්තා පොඩි පුතාට අවවාද කළා. එදා ඉඳලා පොඩි වලස් පුතා හොඳ ළමයකු වුණා. වලස් අම්මයි තාත්තයි පුතාගේ වෙනස් වීම අගය කළා. වලස් පවුලෙ හැම දෙනා ම හරි ම සතුටෙන් කල් ගෙවුවා.

කීකරු - අකීකරු
ප්‍රශ්න - පිළිතුරු
ගැළපෙන - නොගැළපෙන
සෙමින් - වේගයෙන්
පුරුදු - නුපුරුදු

1. වලස් අයියා හරි ම කීකරු යි.
   වලස් මල්ලි හරි ම අකීකරු යි.

2. ..............................................................................................................

..............................................................................................................

3. ..............................................................................................................

..............................................................................................................

4. ..............................................................................................................

..............................................................................................................

5. ..............................................................................................................

..............................................................................................................

- නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

1. ඉතා ............................................ දුවගෙන ගිය තිපුන් තරගයේ පළමුවැනියා විය.
   තරගයේ අන්තිමයා වූයේ ............................................ දුවගෙන ගිය තාරකා ය.
   (සෙමෙන් - වේගයෙන්)
2. වලස් අයියා හරි ම ............................................ යි.
   වලස් මල්ලී හරි ම ............................................ යි.
   (කීකරු - අකීකරු)
3. විභාගයට ............................................ දහයක් තිබිණි.
   ඒවාට ............................................ ලිවීම ඉතා පහසු විය.
   (ප්‍රශ්න - පිළිතුරු)
4. ............................................ රූපයට වචනය යා කරන්න.
   ............................................ වචනය කපා හරින්න.
   (ගැළපෙන - නොගැළපෙන)
5. වලස් අයියා ............................................ තැනකින් නැවේ ය.
   වලස් මල්ලි ............................................ තැනකින් නැවේ ය.
   (පුරුදු - නුපුරුදු)